# ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය අත් විඳින අයට උපකාර වීම



We speak your language ☎ 13 1202

*Helping people experiencing Domestic Violence* - **Sinhalese**

ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩතාවය සිදු වනුයේ යම් පුද්ගලයෙකු විසින් සිය සහකරු හෝ අනෙකුත් පවුලේ සාමාජිකයන් පාලනය කිරීමට උත්සාහ දරන විටදීය. මේ පාලක හැසිරීම් රටාවට පහරදීම්, තරජන, ලිංගික අපචාරයන්, නින්දා අපහාස (අවනම්බු කිරීම්), මුදල් සූරාකෑම් සහ පවුලේ අය සමග හෝ මිත්‍රයින් සමග සම්බන්ධතා පැවැත්වීමට ඉඩ නොදීම වැනි සමාජීය වශයෙන් හුදෙකලා කිරීම යනාදිය ඇතුලත් විය හැක. ප්‍රචණ්ඩතාවයට ගොදුරු වූවන් එවැනි පීඩනකාරී සම්බන්ධතාවයකින් අත්මිදීමෙන් පසුව වුවද තමන් හෝ තම දරුවන් පිළිබඳ බියකින් ජීවත් වනු ඇත.

## ප්‍රචණ්ඩත්වය අත් විඳින්නන්ට උපකාර කිරීම පිණිස Centrelink හි කැපවීම

ඔබ ගෘහස්ථ හෝ පවුල් ප්‍රචණ්ඩතාවයට යටත් අවස්ථාවක පසුවේ නම් හෝ එවැනි ප්‍රචණ්ඩ සම්බන්ධතාවයක් අත් හැර ඇත්නම් Centrelink මගින් ඔබට උපකාර කළ හැක. ඔබට ලබා ගැනීමට හිමිකම් ඇති ගෙවීම් සහ සේවාවන් පිළිබඳ තොරතුරු ලබා දීමට අපට පුළුවන. එසේම Centrelink සමාජ සේවකයකු සමග පුද්ගලික සහ රහසිගත සම්මුඛ සාකච්ඡාවක් සඳහා ඉල්ලුම් කිරීමටද ඔබට හැකියාවක් ඇත.

### ගෘහස්ථ සහ පවුල් ප්‍රචණ්ඩතාවය අත් විඳින අයට උපකාර කරනු පිණිස Centrelink කාර්ය මණ්ඩලය පහත දෑ පිළිබඳව කටයුතු කිරීමට සහතික වනු ඇත:

- පුද්ගලිකත්වය සහ රසහ්‍යභාවය ආරක්ෂා කිරීම පිණිස අමතර ක්‍රියා මාර්ග ඇතුළුව ඔබේ ආරක්ෂාව;
- ඔබේ පුද්ගලික අවශ්‍යතාවයනට උපරිම වශයෙන් සරිලන පරිදි ක්ෂණික මිත්‍රශීලී සහ කාර්යක්ෂම සේවාව;
- හැකි සෑම අවස්ථාවකදීම සේවාලාභින්ට ඔවුන් සහ ඔවුනගේ දරුවන් නඩත්තු කිරීම සඳහා කඩිනම් ගෙවීම් සහිත ආදායම් සහයක ගෙවීම් පිළිබඳව නිවැරදි සහ පූර්ණ තක්සේරුව;
- අනෙකුත් ප්‍රජා සේවාවන් පිළිබඳ තොරතුරු සහ සේවාවන් සඳහා යොමු කිරීම;
- ද්විභාෂික සේවකයකු (ලබාගත හැකි අවස්ථාවන්හිදී) හෝ භාෂා පරිවර්තකයෙකු මගින් ඔබේ භාෂාවෙන් සහාය ලබා දිම;

## Centrelink ගෙවීම්

Crisis Payment, Parenting Payment, Family Tax Benefit, හෝ Newstart Allowance වැනි Centrelink ගෙවීම් සඳහා අවස්ථානුගත තත්වයන් මත ඔබ සුදුසුකම් ලබනු ඇතග අප ඔබට අයිතියක් වශයෙන් ලබාගත හැකි දේ ගණනය කොට ඔබේ හිමිකම් සම්බන්ධයෙන් උපකාර කරන්නෙමුග

## සමාජ සේවකයින්

Centrelink කාර්යාලයයන් සහ ඇමතුම් මධ්‍යස්ථානයන්හිදී වෘත්තීමය සුදුසුකම් ලත් සමාජ සේවකයින්ගේ සේවය ලබාගත හැකිය. කාර්යාලය තුල පුද්ගලික සම්මුඛ සාකච්ඡාවන් පිළියෙල කිරීමට අපට හැකි අතර නොඑසේ නම් සමාජ සේවකයකු හට ඔබේ නිවසේදී හෝ මිත්‍රයකුගේ හෝ ඥාතියකුගේ නිවසක් වැනි වෙනත් ස්ථානයක හෝ ප්‍රජාස්ථානයකදී ඔබ මුන ගැසිය හැක.

## ඔබ බිරිඳකු හෝ සැමියකු හෝ විවාහ ගිවිසගත්තකු ලෙස මෑතකදී ඔස්ට්‍රේලියාවට පැමිණි ගෘහස්ථ හෝ පවුල් ප්‍රචණ්ඩත්වයට ගොදුරුවූවෙක්ද?

ගෘහස්ථ ප්‍රචණ්ඩතාවය යනු අපරාධයක් වන අතර එය ඔස්ට්‍රේලියාව තුල අසම්මත දෙයක් බව සිත්හි තබාගන්න. නිත්‍යවාසය ලබා ගැනීම සඳහාම පමණක් ප්‍රචණ්ඩකාරී තත්වයක රැඳී සිටීමට ඔබට අවශ්‍ය නොවනු ඇත.

සිංහල භාෂාවෙන් වැඩිපුර විස්තර සඳහා දුරකථන අංක **13 1202*** අමතන්න. **www.centrelink.gov.au** හි ඇති වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

**අංක 13න් පටන් ගන්නා දුරකථන අංක සඳහා ඔස්ට්‍රේලියාව තුල වැය වනුයේ ශත 25 කි. 1800 න් පටන් ගන්නා අංක සඳහා මුදල් අය නොකෙරේ. පොදු දුරකථන සහ ජංගම දුරකථන වලින් කෙරෙන ඇමතුම් සඳහා වැඩි මුදලක් අයකෙරෙනු ඇත .*



Australian Government

Centrelink
giving you options